චක්‍රලේඛ අංක : 06/2024

WPCEC/MA01/චක්‍රලේඛ

සමුපකාර සේවක කොමිෂන් සභාව(බ.ප)
අංක 628,
ජනජය සිටි ගොඩනැගිල්ල
8 වන මහල, නාවල පාර
රාජගිරිය
2024.04.01

බස්නාහිර පළාතේ
සියළුම වි.සේ.ස සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමුපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමුපකාර සමිති,
සභාපතිවරුන් වෙත.

**<u>සියළුම වි.සේ.ස සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමුපකාර ණය දෙන සමිති, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමුපකාර සමිති වල ප්‍රධාන පරිපාලන මට්ටමේ තනතුරු වල පත්කිරීම් සම්බන්ධයෙනි.</u>**

ඉහත දක්වන ලද සමුපකාර සමිතිවල පිරිස් බල තක්සේරුව අනුව ප්‍රධාන ගණන් දීමේ නිළධාරි වශයෙන් කටයුතු කරනු ලබන ප්‍රධාන පරිපාලන මට්ටමේ තනතුරු වලට අදාල මූල්‍ය කටයුතු පිළිබඳව වගකීම් හා කාර්යභාරයන් සැලකිල්ලට ගෙන එම තනතුරු වලට අදාල පුරප්පාඩු සම්පූර්ණ කිරීම, මින් ඉදිරියට කොන්ත්‍රාත් පදනමින් සිදු නොකිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

02. ඒ අනුව එම තනතුරු වල පුරප්පාඩු සඳහා ස්ථිර වශයෙන් බඳවාගැනීම් සිදු කරන තෙක්, වැඩ බැලීම හෝ රාජකාරි ඉටුකිරීම හෝ රාජකාරි අවරණය කර ගැනීම හෝ වන පරිදි සමිතිය අභ්‍යන්තරයේ ස්ථිර පත්වීම් ලාභීන් අතරින් වැඩපිළිවෙලක් යොදා ගැනීමට කටයුතු කල යුතු වේ .එසේම මෙම තනතුරු පුරප්පාඩු ස්ථිරව පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමටද කටයුතු කල යුතු වේ.

03. මේ වන විටත් මෙම තනතුරු වල කොන්ත්‍රාත් පදනම මත පත්වීම් අනුමැතිය ලබා ඇති සේවකයින්ට එම පත්වීම් කාලය අවසන් වන තෙක් තවදුරටත් සේවය කිරීමට මෙම චක්‍රලේඛ විධිවිධාන බාධාවක් නොවේ.

04. මෙම චක්‍රලේඛය 2024.04.15 දින සිට ක්‍රියාත්මක වන අතර සමුපකාර සමිති වල ජ්‍යෙෂ්ඨ කළමණාකරන මට්ටමේ තනතුරු වලට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට මීට ප්‍රථම සලසා ඇති විධිවිධාන එදින සිට අවලංගු වේ.

කොමිෂන් සභා නියමය පරිදි

එස්.ජේ.ජයසිංහ
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත.

පිටපත් :1. ලේකම්, පළාත් මාර්ග , ප්‍රවාහන සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප) - කා.දැ.ගැ.පි
2. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ත්‍රාර් (බ.ප) - කා.දැ.ගැ.පි